විගණකාධිපති චක්‍රලේඛ අංක - 2017/05 2017 පෙබරවාරි දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

සියළුම නිලධාරීන් වෙත

**විනයානුකූල පරීක්ෂණ සඳහා පෙනී සිටීම**

**------------------------------------------**

බාහිර ආයතනවල නිලධාරීන් සම්බන්ධයෙන් වූ විනයානුකූල පරීක්ෂණ සඳහා පැමිණිල්ල හෝ විත්තිය වෙනුවෙන් පෙනී සිටීමට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට අවස්ථාව ලබා නොදී සිටීමට දෙපාර්තමේන්තුවේ උන්නතිය වෙනුවෙන් මා විසින් තීරණය කරනු ලැබ ඇත.

02. එසේ වුවද, ඇතැම් විනය පරීක්ෂණවලදී එම රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා රාජ්‍ය මූල්‍ය හා පරිපාලනය පිළිබඳ අවබෝධයක් ඇති විගණන නිලධාරීන්ට විගණකාධිපතිගේ අනුමැතිය යටතේ අවස්ථාව ලබාදීමටත්, අදාළ චෝදනාව ගොඩනැගී ඇත්තේ විගණන පරීක්ෂණයක් හේතුවෙන් නම්එවැනි අවස්ථාවලදී විගණන නිලධාරීන්ට පෙනී සිටීමට අවස්ථාව ලබා නොදීමටත් විගණකාධිපතිවරයාට තීරණය කළ හැක.

03. මෙම සීමාවන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විනයානුකූල පරීක්ෂණ සම්බන්ධයෙන් අදාළ නොවනු ඇත. එවැනි විනයානුකූල පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස ඔබ වෙත කරන ලද කුමන ආකාරයක හෝ ඉල්ලීමක් නොපමාව මා වෙත යොමු කිරීමට වග බලා ගන්නා ලෙස ද මෙයින් දැනුම් දෙමි.

04. දෙපාර්තමේන්තුවේ විනය පරීක්ෂණයක් සම්බන්ධයෙන් ඔබ පෙනී සිටීමට අදහස් කරන්නේ නම් ඊට එකඟතාවය පල කිරීමට පෙර මා වෙත ඉල්ලුම් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

විගණකාධිපති